[All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියට (සාමාන්‍ය සේවක සංඛ්‍යාවට / විශේෂ සේවක සංඛ්‍යාවට) බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2005(2006)

(01) අවබෝධය

පැය එකයි මිනිත්තු තිහයි

ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.

1. පහත දැක්වෙන පාඨ කියවා, එක් එක් පාඨයෙහි ප්‍රධාන අදහස හැකිතාක් නොඅඩුවෙන් එක් වාක්‍යයකින් ලියා දක්වන්න. තද කළු අකුරින් දැක්වෙන යෙදුම්වලට විවරණ සපයන්න.

(අ) ශිශිර කාලය ළඟා වෙද්දී හිමෙන් ගොඩබිම වැසී යන්ම ශීත ප්‍රදේශ කෙරෙන් පියාඹා එන පක්ෂීන් පරිද්දෙන් ග්‍රීසිය, රෝමය වැනි අපරදිග රාජ්‍යවලින් ද මිසරය, අරාබිය වැනි මැද පෙරදිග දේශවලින් ද ආසන්නයේ පිහිටි භාරතයෙන් සහ ඈත පෙරදිග චීනයෙන් ද, අතීතයේ පටන්ම දේශ සංචාරකයෝ ලඬදිවට ඇදී ආහ. **සරඹයට පැ සංචාරකයනට** ලඬදිව ඉතා සැපදායක පරිසරයක් ඇති සේම භූමියක් විය.

(ආ) **ශාස්ත්‍රාධ්‍යාම කුසල සම්පන්න වූ ජානුකාව** තමා දන් සකල ශාස්ත්‍රයම නොවළඟා ඉගැන්වීම ආචාර්යවරයාගේ පරම ශ්‍රුතුකම් විය. ශිෂ්‍යයා තමා අභිමතවා යෙහි යි සැකයෙන් ගුරු මුෂ්ටි වශයෙන් කිසියම් දැනුම් විශේෂයක් ධාරණා කැරීම ආචාර්යවරයාගේ අතින් සිදු විය හැකි වූ සංක්‍රාන්ති වාදෙසකි. ශාස්ත්‍රාදානය ධනෝපායන මාර්ගයක් කර ගත් ගුරුවරයා සමාජය විසින් පිටු දක්නා ලදී. නිස්සරණාධ්‍යාශයෙන් ශාස්ත්‍ර දානයෙහි යෙදුණු මහඟු ආචාර්යවරයා සියල්ලන්ගේ ම ආදර ගෞරවයට පාත්‍ර විය.

(ඉ) පෘතුගීසි පාලකයන් සහ නිලධරයන් අතර ලංකාවේ ජාතික භාෂා පිළිබඳ උනන්දුවක් දැක් වූ එක ද අයකු සම්බන්ධයෙන් වත් තොරතුරු දැන ගැනීම උගහට ය. පෘතුගීසිය පාලන භාෂාව විය. ක්‍රිස්තියානි දේශිකයන් සමග අදහස් හුවමාරු කර ගැනීම සඳහා නෝල්ඩ්කයන් යෙදවීමට නිලධරයනට සිදු විය. අදහස් කෙළින්ම හුවමාරු කර ගත හැකි වූයේ ලාංකිකයන් විසින් ම පෘතුගීසි භාෂාව හැදෑරීමෙන් මිස එයට **ප්‍රතිලෝම ක්‍රියා මාර්ගය** වූ පෘතුගීසි නිලධරයන් රටේ භාෂා ඉගෙනීමෙන් නොවේ.

2. පහත දැක්වෙන පාඨය වචන 90 ක් පමණ වන සේ සාරාංශ කොට ලියා ඊට **සුදුසු මාතෘකාවක්** ද යොදන්න. සාරාංශයේ අග ඔබ යෙදූ වචන සංඛ්‍යාව ලියා දක්වන්න.

සාර්ථක වූ අධ්‍යාපන ක්‍රමයක් ගොඩ නැඟීමේ දී පුද්ගලයාගේ දෛනික ජීවිතයේ අවශ්‍යතා පිරිමසාලීම හෝ ජාතියේ ආර්ථික හා සාමාජීය හා අවශ්‍යතා සපුරාලීම හෝ ප්‍රමාණවත් නොවන බව මගේ ස්ථිර විශ්වාසයයි. මිනිසාගේ ආධ්‍යාත්මික පාරිශුද්ධත්ය ඇති කරලීමෙහි පොහොසත් වෛතසික පුහුණුවක් අධ්‍යාපනයෙන් ලැබිය යුතු බව මගේ හැඟීම යි. තමා පිළිබඳවත් සමාජය පිළිබඳවත් නිවැරදි වූ අවබෝධයෙන් යුක්තව ජීවත් විය හැකි පරිදි චින්ත සමෝධානයකින් යුක්ත වූ යෞවන පරම්පරාවක් ගොඩනංවාලීමට සැබෑ අධ්‍යාපනය පොහොසත් විය යුතුය. සතර අගතියෙන් තොරව මිනිසාගේ සහෝදරත්වය අගය කරන ජන සමාජයක් ගොඩනංවා ලිය හැකි වන්නේ ආධ්‍යාත්මික වශයෙන් දියුණු වූ එබඳු ජනතාවක් ඇති වූ විටය. වර්තමාන ලෝකය භේදයෙන් හින්න වී එසිනෙක ජාතීන් තෙරෙහි සැකයෙන් හා වෛරයෙන් පසුවීමේ රහස තම ආධ්‍යාත්මික වශයෙන් ඔවුන් තුළ සැබෑ සන්තුෂ්ටියක් හෝ චින්ත සමාධියක් හෝ නැති වීමයි.

නූතන යුගයෙහි විද්‍යාව උපයෝගී කරගත් මිනිසා, ග්‍රහලෝක තරණය කිරීමට තරම් විද්‍යාව හා ගණිත මනිනාදිය ද අතින් දියුණුව ලබා ඇතත් අභ්‍යන්තර සාමයෙන් හා සන්තුෂ්ටියෙන් තොර වූවෙකි. නුදු ඉදුරන් පිනවීමේ ආශාව පමණක් නොව, ද්වේෂය, වෛරය, සැකය යන මේ දුර්ගුණයන්ගෙන් පෙළෙන හෙයෙම ලෞකික සැප සම්පත් අගය කරන තරඟකාරී ලෝකයෙක අතරමං වූවෙකි. විද්‍යාව උපයෝගී කරගත් මිනිසා ලෞකික වශයෙන් විස්මයජනක දේ නැනීමෙහි, මැවීමෙහි සමත් වුව ද අද ලොව මුහුණ පා ඇති විනාශකාරී තර්ජනයට හේතුව සොයා සුදුසු ප්‍රතිකාර යොදා ගැනීමෙහි අසමත්ව සිටී. සම්‍යග් මාර්ගයෙහි ගමන් කරමින් තෘප්තිමත් සන්සුන් ජීවිතයක් ගත කිරීමට මිනිසා අපොහොසත් වීම නිසා සදාචාර ප්‍රතිපත්තිවල වරිතාකම් අද ඔහු සින් තුළින් ගිලිහී සිඹේ. මේ ආධ්‍යාත්මික පරිහානියට තුඩු යුතු ප්‍රතිකර්මය නම් චින්ත සමාධානයෙහි අගය මොනොවට වටහා දෙන සදාචාර ප්‍රතිපත්ති අගය කෙරෙන, අධ්‍යාපන ක්‍රමයක් පනඟ කරලීමයි. එපමණක් ද නොව ඒ සමග අපේ සනාතන ධර්මයන්ගේ වරිතාකම් යෞවන පරම්පරාවේ සිත් තුළට ඇතුළු කරලීම අභිශයින් වැදගත් බැව් පෙනේ.

EXAMMOOD.LK